# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.28 පැය 1430 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/162 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මුහුදු සීමාව උල්ලංඝනය කර ධීවර කටයුතු වල යෙදී සිටි ඉන්දීය ධීවරයින් පිරිසක් අත්අඩංගුවට ගැනීම - කන්කසන්තුරය පොලිස් ස්ථානය**

2025.01.27 වන දින රාත්‍රී කාලයේ කන්කසන්තුරය මුහුදු සීමාවේ ඉන්දීය ධීවරයින් පිරිසක් සංචාරයේ යෙදෙමින් මුහුදු සීමාව උල්ලංඝනය කර ධීවර කටයුතු වල යෙදෙන බවට උත්තර නාවික හමුදාවේ නිලධාරියෙකු විසින් කන්කසන්තුරය පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, මෙම ඉන්දීය ධීවරයින් පිරිස අත්අඩංගුවට ගැනීමට යාමේදී ඉන්දීය ධීවරයෙකු විසින් නාවික හමුදා නිලධාරියෙකු සමඟ පොර බැදීමක් සිදුව ඇති බවත් එහිදී නාවික හමුදා නිලධාරියාගේ රාජකාරි ගිනි අවිය ස්වංක්‍රීයව ක්‍රියාත්මක වී ඇති බවට පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

එහිදි, ධීවරයින් දෙදෙනෙකුගේ පාද වලට වෙඩි වැදී තුවාල සිදුව ඇති අතර, එම දෙදෙනා යාපනය මහ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබන බවටත් ප්‍රකාශයක් ලබා දී ඇත. තවද, ධීවරයින් 11 දෙනෙකු, බහුදින යාත්‍රාව ඇතුළු දේපළ නාවික හමුදා භාරයට ගෙන ඇත. කන්කසන්තුරය පොලිසිය මඟින් සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**